# මී කිරි හට්ටිය



චෙනුත් දුල්දිනි කුමාරි දිසානායක

**මී කිරි හට්ටිය**

**ඩී.එම්. වෙනුත් දුල්දිනි කුමාරි දිසානායක**

**පළමු මුද්‍රණය - 2023 ඔක්තෝබර්**

**ISBN : 978-624-208-024-6**

# පිදුම

අකුරු වලින් වචන හදන්නට

ඉගැන්වූ

ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මැණියන්ටත්

ආදරණීය අම්මාටත් අප්පච්චීටත්

සෙනෙහසින්

පුදමි.

**ස්තූතිය!**

ලොව දිනන්නට දිරිය දෙන

මහනුවර මහාමායා බාලිකාවේ ගරු විදුහල්පතිතුමියටත්

ප්‍රාථමික අංශ භාර නියෝජ්‍ය විදුහල්පතිතුමියටත්

පන්ති භාර ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මෑණියන්ටත්

ආදරණීය අම්මාටත් අප්පච්චීටත්

මගේ වචන, රූප පොතක් කරන්නට

නොයෙක් ලෙසින් උපකාර කල සියළු දෙනාටත්

මාගේ ගෞරවණීය ස්තූතිය පුද කරමි!

ඩී.එම්. වෙනුති දුල්දිනි කුමාරි දිසානායක
2 ශ්‍රේණිය ඩී
මහාමායා බාලිකා විදුහල
මහනුවර



# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුලින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන්උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවය සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුල ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටත් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කල "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි  ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවන් සහය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැම හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20

ඔන්න එකමත් එක ගමක හිටියා මලිත් කියලා පුංචි ගැහැණු ළමයෙක්. මලිත් හරිම කැමතියි මී කිරි කන්න.



දවසක් මලිත්ගේ අම්මා
මලිත්ට මෙහෙම කිවුවා.

"මලිත් පුතේ, ඔන්න අද
අත්තම්මලාගේ ගමෙන් මී කිරි
එවනවා කිවුවා".

"මී කිරි මම කැමතිම කෑම"
මලිත් සතුටින් කිවුවා.

"ඉස්කෝලේ ගිහින් ඇවිත්

මී කිරි කමු". අම්මා කිවුවා.

දවල් වෙද්දී ගමෙන් ආව මාමා
කෙනෙක් ලොකු මී කිරි
හට්ටියක් ගෙනාවා.



අම්මා “බොහෝම ස්තූතියි” කියලා
මී කිරි හට්ටිය ගත්තා.
ඊට පස්සේ ඒක මේසේ උඩින් තියලා
රෙදි සෝදන්න ගියා.

එකපාරටම “දඩස්” ගාලා
ශබ්දයක් ආවා.

අම්මා බය වෙලා වේගයෙන්
දුවලා ඇවිත් බැලුවා.

අම්මා බලද්දි මලිතිගේ මල්ලි
මේසය උඩ තිබුණ මී කිරි හට්ටිය
බිමට ඇදලා.



මී කිරි උඩ මල්ලි සෙල්ලම්
කරනවා.

අම්මාට මලිත් ගැන දුක
හිතුණා.
අම්මා කඩෙන් මී කිරි
හට්ටියක් ගෙනාවා.



මලිත් ඉස්කෝලේ ගිහින් ආවා.

මලිත් අම්මා ගෙන් මෙහෙම ඇහුවා.

"අම්මේ, කෝ මී කිරි ? "

"මෙන්න තියනවා " අම්මා කිවුවා.



මලිත් සතුටින් මී කිරි කෑවා.

මලිත් මී කිරි කෑවේ තනියම නෙවෙයි.

අම්මාට, මල්ලීට දීලා.

තාත්තාටත් ඉතුරු කළා.

අම්මා ඊ කෑමේදී මල්ලි කරපු දේ හැමෝටම කිවුවා.

"මගේ හොඳ අම්මා" කියලා මලිති අම්මාව බදා ගත්තා.





**ඩී.එම්. වෙනුති දුල්දිනි කුමාරි දිසානායක**
**2 ශ්‍රේණිය D**
**මහ/ මහමායා බාලිකා විද්‍යාලය**

## පසුවදන

නූතන තාක්‍ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොත පෙතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නංවීම තුළින් රටේ සාහිත්‍යය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩනැඟී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකිම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම්, නිර්මාණාත්මක හැකියාවන්, ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන් මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්ගතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කරුවරයෙකු විමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023 .10. 20